සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
## අදියර III විභාගය - 2023 අගෝස්තු

## (304) සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය
**(Corporate & Personal Taxation)**

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන : 09

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය)፦
  (1) **දී ඇති කාලය** : පැය 03 යි.
  (2) **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුවේ.**
  (3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්**, ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
  (4) ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.
  (5) වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිතා කිරීමට ඉඩ දෙනු ලැබේ.
  (6) අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරිකෂා** ලැයිස්තුව අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරිකෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.
  (7) ලකුණු 100 යි.

**සැකසුම :- නුවන් සමීර**

---

## A කොටස

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

2017 අංක 24 දරණ දේශීය ආදායම් බදු පනතට අනුව බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තකු හෝ අවසාන රඳවා ගැනීමේ ගෙවීමක් ලබන තැනැත්තකු බදු ගෙවීමට යටත් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ፦**

a) 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව තැනැත්තා යන්න අර්ථ දක්වන්න.
(ලකුණු 03)

b) ඉහත බදු පනතට අනුව බද්දට යටත් වන ප්‍රධාන ආදායම් ප්‍රභවයන් නම් කරන්න.
(ලකුණු 02)
(මුළු ලකුණු 05)

### 02 වන ප්‍රශ්නය

නව බදු සංශෝධන අනුව 2020/04/01 දින සිට බලපැවැත්වෙන පරිදි අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සහ අත්තිකාරම් ආදායම් බද්ද ක්‍රියාත්මක වේ. 2017 අංක 24 දරණ දේශීය ආදායම් බදු පනතට අනුව,

a) අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (Advance Personal Income Tax- APIT) යනු කුමක්ද?
(ලකුණු 03)

b) අත්තිකාරම් ආදායම් බද්ද (Advance Income Tax- AIT) යනු කුමක්ද?
(ලකුණු 02)
(මුළු ලකුණු 05)

JMC vLearning "your virtual learning partner"

## 03 වන ප්‍රශ්නය

a) දේශීය ආදායම් පනතට අනුව හඳුනාගත හැකි තක්සේරු වර්ග හතරක් නම් කරන්න.

(ලකුණු 03)

b) තක්සේරුවකට එරෙහිව  අභියාචනා කිරීමේ පිළිවෙල දක්වන්න.

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

පහත ගෙවීම් වර්ගයන්ට අදාළ වන රඳවා ගැනීමේ බදු අනුපාත දක්වන්න.

a)

I. ලොතරැයි , ත්‍යාග , ඔට්ටු ඇල්ලීම් හෝ සූදු දිනුම් මත.

II. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් පවත්වන වෙන්දේසියේ විකුණන මැණික් විකුණුම් මත.

III. ලාභාංශ මත.

(ලකුණු 03)

b) රඳවා ගැනීමේ බදු ආයෝජිතයෙකුගේ වගකීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

A කොටසෙහි අවසානය

**B කොටස**

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

අමල් සහ නිමල් පාවහන් නිෂ්පාදකයකු වශයෙන් කටයුතු කිරීම සඳහා 2017 වසරේදී (AN Shoes) නමින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. හවුල් ගිවිසුම අනුව ලාභ ලාභ පිළිවෙලින් 2:1 අනුපාතයට අමල් හා නිමල් අතර බෙදා ගැනීමට එකඟ විය.

2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය රු. 55,250,000 කි.

1) ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩුකර තිබේ.

| | රු. |
|---|---:|
| වැටුප් | 9,750,000 |
| ප්‍රාග්ධන පොලී | 1,500,000 |
| පරිත්‍යාග | 500,000 |
| ණය පොලී | 750,000 |
| ක්ෂය | 95,000 |
| වෙනත් වියදම් | 3,250,000 |

2) ඉහත ශුද්ධ ලාභය තුළ හවුල් ව්‍යාපාරය ගොඩනැගිල්ලක් කුලියට ලබා දීමෙන් මසකට රු.75,000 ක් බැගින් ලැබූ කුලී ආදායමක් ඇතුළත්ව ඇත.

3) ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ වීම වෙනුවෙන් අමල් හා නිමල් පිළිවෙලින් මසකට රු.125,000 ක් සහ රු.100,000 ක් බැගින් ලබාගත් වැටුප් ඉහත වැටුප් ගෙවීම් තුළ ඇතුළත්ව ඇත.

4) අමල්ට හා නිමල්ට පිළිවෙලින් රු.800,000 ක් හා රු.700,000 ක් බැගින් ප්‍රාග්ධන පොලී ගෙවා ඇත.

5) රජයේ රෝහලකට පරිත්‍යාග කළ ගිලන් ඇඳන්වල වටිනාකම පරිත්‍යාග තුළ දක්වා ඇත.

6) අමල් ව්‍යාපාරයට යෙදවූ ණය මුදල වෙනුවෙන් රු.750,000 ක පොළී මුදලක් තක්සේරු වර්ෂය තුළ ඔහුට ගෙවා ඇත.

7) 2022/23 තක්සේරු වර්ෂය සඳහා බදු අරමුණු සඳහා වත්කම් මත ප්‍රාග්ධන දීමනාව රු.105,000 කි.

8) වෙනත් වියදම් බදු අරමුණු සඳහා ඉඩ දෙන වියදම් වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ බදු වගකීම ගණනය කරන්න

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

සී/ස AB පුද්ගලික සමාගම එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සමාගමකි. මෙම සමාගම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වූ ආපනශාලාවක් පවත්වාගෙන යනු ලබන අතර ඊට අමතරව තොග හා සිල්ලර වෙළඳසැලක් (Super Market) පවත්වාගෙන යනු ලබයි.

2023 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා සමාගමේ පොත්වලින් පහත තොරතුරු උපුටාගෙන ඇත.

(1) ආපනශාලාවේ මුළු යෙදවුම් වලින් 62% පමණ දේශීය මූලාශ්‍ර වලින් යොදාගත් යෙදවුම් වලින් සමන්විත වේ.

(2) පිරිවැටුම

| | රු. |
|---|---|
| ආපනශාලාව (VAT රහිතව) | 25,750,000 |
| වෙළඳසැළහි: | |
| • බද්දට යටත් භාණ්ඩ සැපයුම් (VAT සහිතව) | 45,250,000 |
| • සරල එකතු කළ අගය මත බදු (SVAT) සඳහා ලියාපදිංචි වූ දේශීය ගනුදෙනුකරුවන්ට විකුණුම් | 24,500,000 |
| • ආනයනික මත්පැන් තානාපති සේවයේ නිලධාරීන්ට විකුණුම් | 15,000,000 |

(3) ගෙවන ලද එකතු කල අගය මත යෙදවුම් බදු

| | රු. |
|---|---|
| දේශීය මිලදී ගැනීම් මත | 1,275,000 |
| ආනයනික අමුද්‍රව්‍ය මත | 1,025,000 |
| | |
| කාර්යාල වියදම් මත (ඉහත ව්‍යාපාර දෙකම සඳහා කාර්යාලය භාවිතා කරයි) | 650,000 |
| මත්පැන් වෙළඳසැල වෙත ප්‍රවාහනය කර ගැනීමට අදාළ වියදම් මත | 225,000 |

(4) සමාගම වාරික ගෙවීම් පහත පරිදි සිදුකර කර ඇත.

| | රු. |
|---|---|
| 2023/01/20 | 60,000 |
| 2023/02/20 | 75,000 |
| 2023/03/20 | 125,000 |

(5) පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද වැඩිපුර ගෙවූ යෙදවුම් බද්ද රු.60,000 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

a) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු/ (වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද තක්සේරු කරන්න. (ලකුණු 08)

b) 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිත දිනය සඳහන් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

a) සංචාරකයින් සඳහා එකතු කළ අගය මත බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය(Tourist VAT Refund Scheme - TVRS) යටතේ ආපසු ගෙවීම් ලබා ගැනීමට සංචාරකයකු සතු විය යුතු ලක්ෂණ තුනක් (03) නම් කරන්න කරන්න. (ලකුණු 03)

b) එකතු කළ අගය මත සංචාරක බදු ආපසු ලබා දීමේ ක්‍රමවේදයේ ඇති කොන්දේසි තුනක් (03) නම් කරන්න. (ලකුණු 03)

c) සංචාරක බදු ආපසු ලබාදීම සඳහා සුදුසුකම් නොලබන භාණ්ඩ දෙකක් (02) නම් කරන්න. (ලකුණු 02)

d) බද්දට යටත් මූල්‍ය සේවාවන් දෙකක් (02) නම් කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

B කොටසෙහි අවසානය

JMC vLearning "your virtual learning partner"

## **C කොටස**

අනිවාර්යය ප්‍රශ්න දෙක (02) කි.

(මුළු ලකුණු 50)

### **08 වන ප්‍රශ්නය**

සීමාසහිත මොඩර්න් ෆැෂන් (පුද්ගලික) සමාගම 2016 මැයි මාසයේදී සංස්ථාපනය කරන ලද අතර පාවහන් නිෂ්පාදනය කර දේශීය වෙළඳපොළෙහි විකිණීමේ නිරතව සිටී. 2023 මාර්තු 31 දිනට සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනය හා මුළු සංචිත පිළිවෙලින් රු. 30,000,000 සහ රු. 18,800,000 විය. පහත සඳහන් තොරතුරු සමාගමේ මූල්‍ය ප්‍රකාශන වලින් උපුටා ගන්නා ලදී.

(1) 2022/23 තක්සේරු වර්ෂය සඳහා සමාගමේ පිරිවැටුම සහ ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය පිළිවෙලින් රු.520,400,000 ක් සහ රු. 25,750,000 විය.

(2) වෙනත් ආදායම්වල පහත දෑ ඇතුළත් විය.

| | රු. |
|---|---|
| ස්ථාවර තැන්පතු වලින් ලද පොලිය | 5,100,000 |
| ලැබූ ශුද්ධ ලාභාංශ | 350,000 |
| ලොරි රථය විකිණීමෙන් ලද ලාභය | 1,500,000 |
| කුලී ආදායම් | 1,750,000 |
| ගොඩනැගිල්ල විකිණීමෙන් ලද ලාභය | 1,680,000 |

(3) දේපල පිරියත සහ උපකරණ පිලිබඳ විස්තරː

**පිරිවැය**

| **වත්කම්** | **2022 අප්‍රේල් 01 දිනට ශේෂය රු.** | **එකතු කිරීම් රු.** | **ඉවත් කිරීම් රු.** | **2023 මාර්තු 31 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| ඉඩම | 20,000,000 | - | - | 20,000,000 |
| ගොඩනැගිල්ල | 12,000,000 | 800,000 | - | 12,800,000 |
| පරිගණක | 800,000 | - | - | 800,000 |
| දේශීයව සංවර්ධනය කළ මෘදුකාංග | 400,000 | - | - | 400,000 |
| ලී බඩු | 750,000 | 50,000 | - | 800,000 |
| යන්ත්‍ර | 6,750,000 | 500,000 | - | 7,250,000 |
| මෝටර් ලොරි | 12,000,000 | 10,000,000 | 4,000,000 | 18,000,000 |

- ආරම්භක ශේෂයේ ඇති වත්කම් සියල්ල ව්‍යාපාරය ආරම්භ කරන ලද අවස්ථාවේ දී අත්පත් කරගෙන ඇත.
- තක්සේරු වර්ෂය තුළ භාවිතයේ පැවති මෝටර් ලොරි රථයත් රු.2,500,000 කට විකුණා ඒ වෙනුවට නවීන මෝටර් රථයක් මාස 48 ක මූල්‍ය කල්බදු ගිවිසුමක් යටතේ අත්පත් කරගෙන ඇත. කල්බදු වාරිකය රු.210,000 කි. සමාගම වර්ෂය තුළදී කල්බදු වාරික තුනක් ගෙවා ඇත. ආදායම් ප්‍රකාශනයට අය කළ කල්බදු පොලිය රු.450,000 කි.
- සමාගම සතුව මාතර ආයෝජන වත්කමක් ලෙස තබාගත් ගොඩනැගිල්ලක් ඇත. මෙය මසකට රු.175,000 ක් බැගින් තවත් සමාගමකට කුලියට දී තිබූ අතර එම ගොඩනැගිල්ල 2023 ජනවාරි 01 දින රු.9,000,000 කට විකුණන ලදී . 2017 දෙසැම්බර් මාසයේදී රු.7,200,000 කට මෙම ගොඩනැගිල්ල මිලට ගෙන තිබූ අතර විකුණන අවස්ථාවේ දී පහත වියදම් දරා ඇත.

JMC vLearning
"your virtual learning partner"

| | |
|---|---|
| ප්‍රචාරන ගාස්තු | රු.60,000 |
| බ්‍රෝකර් ගාස්තු | රු.40,000 |
| නීතිඥ ගාස්තු | රු.20,000 |

(4) වියදම්වල පහත ඒවා ඇතුළත් විය.

- 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අය කරන ලද ගිණුම රු.10,200,000 කි.
- පාවහන් නිෂ්පාදනයට අදාළ නිෂ්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම හා නිෂ්පාදනවල ප්‍රමිතිය උසස් කිරීම සඳහා විදේශ ආයතනයක් මඟින් සිදුකළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වැය කළ මුදල රු.2,200,000 කි.
- කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ලබාගත් බැංකු ණය සඳහා ගෙවූ ණය පොලිය රු.4,200,000 කි.
- ගනුදෙනුකරුවන් වෙනුවෙන් දරන ලද සංග්‍රහ වියදම් රු.450,000කි.
- කම්කරු ආරවුලකට අදාළව දරන ලද නීතිඥ ගාස්තු රු. 200,000 කි.
- බදු බරක් ලෙස ඉල්ලා සිටිය හැකි කාල සීමාව ඉකුත් වීම නිසා රු.950,000 ක ආර්ථික සේවා ගාස්තුවක් ලියා හැර ඇත.
- ජාතික වකුගඩු අරමුදලට සිදුකළ මුදල් පරිත්‍යාග රු.500,000 කි.
- ආබාධිත පුද්ගලයින්ට ආයතනික රැකවරණය සලසන අනුමත පුණ්‍යායතනයකට සිදුකළ භාණ්ඩ පරිත්‍යාගයේ වටිනාකම රු. 350,000 කි.
- පරිතෝෂික වෙන් කිරීම රු.450,000 කි. වර්ෂය තුළ පරිතෝෂික ලෙස ගෙවීම් කිසිවක් සිදුකර නොතිබිණි.

(5) අනිකුත් සියලු වියදම් බදු අරමුණු සඳහා ඉඩ දෙන වියදම් වේ.
(6) සමාගම ස්වතක්සේරු ආදායම් බදු ලෙස රු.1,200,000 ක් ගෙවා ඇත.
(7) 2023 මාර්තු 31 දිනට සමාගමේ පොත්වල පහත වගකීම් විය.

| | |
|---|---|
| බැංකු ණය | - රු.18,000,000 |
| කල්බදු ණය හිමියෝ | - රු.12,000,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**
2022/23 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ තක්සේරු කරන්න.

a) තක්සේරු කළ හැකි ආදායම
b) බදු අයකළ හැකි ආදායම
c) ගෙවිය යුතු දළ ආදායම් බද්ද
d) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද

**සැලකිය යුතුයි:**
යම් වියදමක් ඉඩදීමට හෝ ඉඩ නොදීමට හේතු පැහැදිලිව සඳහන් කළ යුතුයි.

(මුළු ලකුණු 25)

**09 වන ප්‍රශ්නය**

වයස අවුරුදු 61 ක් වූ නිරාශා මහත්මිය රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව 2019 ජනවාරි 01 වන දින සිට නීති නිළධාරිණියක ලෙස සී/ස ඊසි ෆිනෑන්ස් සමාගමේ සේවයේ යෙදී සිටියි. 2022/23 තක්සේරු වර්ෂය සඳහා ඇයගේ ආදායම් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ලබා දී ඇත.

JMC vLearning "your virtual learning partner"

(1) සේවා නියුක්ති ආදායම

- ශ්‍රී ලංකා රජයෙන් ලැබූ විශ්‍රාම වැටුප මසකට රු. 80,000 බැගින්
- ඊසී ෆිනෑන්ස් සමාගමෙන් ලද දළ වැටුප මසකට රු. 325,000 බැගින්
- 2022 දෙසැම්බර් මාසයේ රු. 500,000 ප්‍රසාද දීමනාවක් ඇයට ලැබී ඇත.
- ඇගේ මවගේ සැත්කමක් වෙනුවෙන් පෞද්ගලික රෝහලකට ගෙවිය යුතු වූ වෛද්‍ය බිල රු. 450,000 කි. එයින් රු. 250,000 මුදලක් සමාගම විසින් නිරාශා මහත්මිය වෙනුවෙන් රෝහලට ගෙවා ඇත.
- සමාගම විසින් මසකට රු. 75,000 ක කුලියකට ලබාගත් නිවසක් නිරාශා මහත්මියට පදිංචිය සඳහා ලබා දී ඇත. මෙම නිවස වෙනුවෙන් ඇය මසකට රු. 15,000 ක් සමාගමට ගෙවනු ලබයි.
- ගෙවන ලද APIT 104,000 කි.

(2) a. වාණිජ බැංකුවක ස්ථාවර තැන්පතු වලින් ලද පොලි

b. විදේශ ව්‍යාවහාර මුදලින් වටිනාකම නියම කර ඇති ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මත ලද පොලිය රු. 400,000 කි.

(3) ඇය ලැයිස්තුගත පොදු සමාගම්වල ආයෝජනය කිරීමෙන් වර්ෂය තුළ රු. 220,000 ක ලාභාංශ ආදායමක් ලබා ඇත.

(4) ඇයට පරම්පරාවෙන් උරුම වූ නිවසක් මහරගම පිහිටා ඇති අතර එය මසකට රු. 60,000 බැගින් 2022/10/01 දින සිට කුලියට දී ඇත. මෙම නිවසේ වරිපනම් තක්සේරුව රු.300,000 කි. වරිපනම් 30% බැගින් ඇය ගෙවා ඇති අතර අළුත්වැඩියා සඳහා දැරූ වියදම රු. 30,000 කි.

(5) ආබාධිත දරුවන් සඳහා ආයතනික රැකවරණය සපයනු ලබන පුණ්‍යායතනයකට පරිත්‍යාග කළ ශීතකරණයෙහි වටිනාකම රු. 300,000 කි.

(6) සී/ස ඊසි ෆිනෑන්ස් සමාගම ඇය වෙනුවෙන් වර්ෂය සඳහා අඩු කළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) රු. 74,000 කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022/23 තක්සේරු වර්ෂය සඳහා නිරාශා මහත්මියගේ පහත සඳහන් දෑ තක්සේරු කරන්න.

a) බදු අය කළ හැකි ආදායම

b) ගෙවිය යුතු දළ ආදායම් බද්ද

c) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද

d) බදු නිදහස් ආදායම් (වේ නම්)

(මුළු ලකුණු 25)

C කොටසෙහි අවසානය

JMCVLearning
your virtual learning partner